# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2065/41 - 2018 අප්‍රේල් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2018.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 57 වන වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 34 වන වගන්තිය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සාදනු ලබන රීති.

සභාපති,
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය.

2018 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.


1A - G 27421-12 (2017/08)

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

රීති

1. මෙම රීති, 2017 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනය) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති තොරතුරු ඇතුළත් කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

උපලේඛනය

කොන්ත්‍රාත්කරුවන්ගේ නාම ලේඛනයේ ඇතුළත් විය යුතු තොරතුරු :

1. කොන්ත්‍රාත්කරුගේ නම හා ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය,
2. කොන්ත්‍රාත්කරු සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය තොරතුරු,
3. කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධරයාගේ නම,
4. ලියාපදිංචි ශ්‍රේණිය හා විශේෂඥතාව,
5. එම කොන්ත්‍රාත්කරුට ලබා දී ඇති ලියාපදිංචි අංකය,
6. ලියාපදිංචි කළ දිනය හා වලංගු කාලය

04-722/1

---

එල්. ඩී. බී. 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 57 වන වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 45 වන වගන්තියේ (4) වන උප වගන්තිය යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් සාදනු ලබන රීති.

සභාපති,
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය.

2018 මාර්තු මස 20 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. මෙම රීති, 2017 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (ගුණාත්මක කළමනාකරණ විගණකවරුන් ලියාපදිංචි කිරීම) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. යම් හඳුනාගත් ඉදිකිරීම් වැඩක තාක්ෂණ විගණනයන් භාර ගැනීමට අදහස් කරන යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ ගුණාත්මක කළමනාකරණ විගණකවරයකු ලෙස එම තැනැත්තා ලියාපදිංචි කරනු පිණිස (මෙහි මින්මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් නියම කරනු ලැබිය හැකි යම් තොරතුරු ද සමග ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

3. එම තැනැත්තන් සතු විය යුතු සුදුසුකම් පහත පරිදි වේ.

(අ) ඉහත කී පනත යටතේ තාක්ෂණ විගණනය සිදු කිරීමට අදාළ වෘත්තීය සුදුසුකම්;
(ආ) අදාළ ක්ෂේත්‍රයේ වසර පහළොවකට නොඅඩු පශ්චාත් උපාධි පළපුරුද්ද;
(ඇ) එකී පනත යටතේ සුදුසුකම්ලත් තැනැත්තකු ලෙස ලියාපදිංචි කර තිබීම;

(ඇ) අදාළ විෂයය ක්ෂේත්‍රය පිළිබඳ වෘත්තීය ආයතනයේ වරලත් සාමාජිකයකු වීම හෝ පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපිත ඉදිකිරීම් කර්මාන්තයට අදාළ යම් ලියාපදිංචි කිරීමේ මණ්ඩලයක් යටතේ ලියාපදිංචි වූ තැනැත්තකු වීම.

4. ගුණාත්මක කළමනාකරණ විගණකවරයකු ලෙස අධිකාරියේ ලියාපදිංචි වූ යම් තැනැත්තකු විසින්, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අදාළ ලියාපදිංචි කිරීමේ ගාස්තු ගෙවීමෙන් පසුව, එම තැනැත්තාට ලියාපදිංචි අංකයක් ලබා දී ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු අතර, එම සහතිකයේ එය වලංගු වන්නා වූ කාල සීමාව නිශ්චිතව දක්වා තිබිය යුතු ය.

5. අධිකාරියේ ලියාපදිංචි වූ සෑම ගුණාත්මක කළමනාකරණ විගණකවරයකුම එම ලියාපදිංචිය ඉකුත් වන දිනයට පෙරාතුව, මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති අලුත් කිරීමේ ගාස්තු ද සමග එම සහතිකය අලුත් කිරීම සඳහා අධිකාරියට අයදුම්පතක් ඉදිරිපත් කළ යුතු ය.

6. මෙම රීතිවල කාර්ය සඳහා -

''හඳුනාගත් ඉදිකිරීම් වැඩ'' යන්නට, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

'' සුදුසුකම් ලත් තැනැත්තා'' යන්නට, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

''තාක්ෂණ විගණනය'' යන්නට, 2014 අංක 33 කරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ එයට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

## උපලේඛනය

ලියාපදිංචි කිරීමේ ගාස්තුව - රු. 30,000 (බදු රහිතව)
වාර්ෂික අලුත් කිරීමේ ගාස්තුව - රු. 5,000 (බදු රහිතව)

04-722/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.